මහජන බැංකුවේ හා එහි පරිපාලිත සමාගම - 2021

-------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් සාරාංශයකින් සමන්විත මහජන බැංකුවේ (“බැංකුව”) මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේහා එහි පරිපාලිත සමාගම්වල (“සමූහය”) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේවිධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මුදල් පනතේ 5(1) වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව 1992 මැයි 14 වන දින අංක 715 දරන රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශනයට පත් කර ඇති මුදල් අමාත්‍යවරයාගේ නියෝගයක් මඟින් 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටසේ සඳහන් විධිවිධානවලින් බැංකුව නිදහස් කර ඇත.

බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව හා සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය බැංකුව හා සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

බැංකුව හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, බැංකුව හා සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා සමාගම හා සමූහය විසින් පවත්වාගෙන යා යුතුය.

**1.4** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස බැංකුවේ හා සමූහයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ හා සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත බැංකුවේ හෝ සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැළසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව බැංකුව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව බැංකුවකටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව බැංකුව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධ විගණන නිරීක්ෂණ

### 1.5.1 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ➢ රු.මිලියන2,783 ක සමුච්ඡිත වූ ශේෂයක් නිරවුල් කිරීමකින් තොරව වසරකට වඩා හිඟව පැවතුණි. | 2022.11.14 දිනට රු.බිලියන 2.783 ක් අතරින් රු. බිලියන 1.968 ක් දැනටමත් ප්‍රාග්ධනිත කර ඇත. | අදාළ කාලසීමාවන් තුළ දීර්ඝ කාලයක් තිස්සේ පවතින අවිනිශ්චිත ගිණුම් නිරවුල් කිරීමට නිර්දේශ කෙරේ. දිගුකාලීනව පවතින නිරවුල් නොකළ අවිනිශ්චිත ගිණුම් ශේෂයන් පිළිබඳ පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය වේ. |
| ➢ දත්ත ගබඩා ව්‍යාපෘතිය(Data Warehouse Project) සඳහා ජස්ට් ඉන් ටයිම්සමාගම (ගැ.ඇ 21458) වෙත සහ අයදුම්පත් නැවත ලිවීමේ වැඩසටහන(Application RewriteProgram) සඳහා ඉනොවා අයි.ටී සිස්ටම්ස් සමාගම (ගැ.ඇ 25629) වෙතගෙවන ලද පිළිවෙලින් රු. මිලියන 137.19 ක සහ රු. මිලියන 47.03 ක අත්තිකාරම් 2021 වර්ෂය අවසානයේදී සම්පූර්ණයෙන්ම අලාභ ලෙස හඳුනාගෙන තිබුණි. | කාර්යයගිවිසුමේ විෂය පථයට අනුව දත්ත ගබඩා ව්‍යාපෘතිය සඳහා ජස්ට් ඉන් ටයිම්සමාගම (ගැ.ඇ 21458) වෙත රු. මිලියන 168.66 ක අත්තිකාරම් ගෙවීමක් කර ඇති අතර බලපත්‍රය කල් ඉකුත් වූ විට ව්‍යාපෘතිය අවසන් කර ඇත. එම නිසා,2021 වර්ෂය අවසානයේදී එය සම්පූර්ණයෙන්ම අලාභයක් ලෙස හඳුනාගෙන ඇත. | ආර්ථික තීරණ ගැන වැඩි සැලකිල්ලක් දැක්විය යුතු අතර එවැනි තීරණ ගැනීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් කළ යුතුය. |

| | | |
|---|---|---|
| | <u>ඉනොවා අයි.ටී සිස්ටම්ස් සමාගම වෙත අත්තිකාරම් ගෙවීම (ගැ.ඇ 25629)</u><br><br>අයදුම්පත් නැවත ලිවීමේ වැඩසටහනසඳහා ඉනොවා අයි.ටී සිස්ටම්ස් සමාගම (ගැ.ඇ 25629) වෙත රු. මිලියන 47.03 ක අත්තිකාරමක් ගෙවා ඇත. යම් ක්ෂේත්‍රයන් සංවර්ධනය කිරීමට අවශ්‍ය විය. මේ වන විට නැවත ලිවීමේ ව්‍යාපෘතිය යටතේ ඇති සියලුම පද්ධති සජීවීව ක්‍රියාත්මක වන අතර අභ්‍යන්තර සංවර්ධන කණ්ඩායමේ මැදිහත්වීමෙන් යම් සංවර්ධනයන් සිදු කර ඇත. ගිවිසුමට අනුව, ඉනොවා අයි.ටී සමාගම විසින් සිදු කරන ලද සංවර්ධන සේවා සඳහා මාසික ගෙවීම් සිදු කර ඇත. පද්ධති දැනට අවශ්‍ය සංවර්ධනයන් සමඟ සජීවීව ක්‍රියාත්මක වන බැවින්, සිදු කරන ලද ප්‍රතිපාදනය සඳහා විභව ආපසු හැරවීමක් සිදු කළ හැකිය. | |
| ➢ ඩිජිටල්කරණ ව්‍යාපෘතියට දරන ලද වියදමට අදාළව පොදු ලේජරගිණුම් ශේෂය,ශේෂ පිරික්සුමේ ශේෂයට වඩා රු. මිලියන 84.63 කින් වැඩි බව නිරීක්ෂණය විය. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ඩිජිටල්කරණ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 84.63ක් ගෙවා ඇත. | වියදම් සිදු වූ බව සනාථ කිරීම සඳහා උපකාරක ලියවිල්ලක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පිළිගත නොහැක. එබැවින් සිදුවීම ඔප්පු කළ හැකි වියදම් දැරිය යුතුය. මෙම වියදම දැරීමට මූලික හේතුව පිළිබඳව තවදුරටත් විධිමත් පරීක්ෂණයක් සිදු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 අප්‍රේල් 29 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පී.ඊ.ඩී 03/2016 හි 2 වන ඡේදයඅනුව,අධ්‍යක්ෂ මණ්ඩලය සහ රාජ්‍ය ව්‍යවසායන්හි ඉහළ කළමනාකාරිත්වය සේවකයින්ගේ උපයන විට ගෙවිය යුතු බද්ද අඩුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීමට වගකීමට බැඳේ. කෙසේ වෙතත්, රාජ්‍ය බැංකු සහ අදාළ සේවක සංගම් අතර අත්සන් කරන ලද සාමූහික ගිවිසුම් මඟින් සේවකයින්ගේ ආදායම් බදු වගකීම සේවකයින්ගේ වැටුප්වලින් අඩු නොකර බැංකුව විසින් ගෙවීමට නියම කර ඇත. ඒ මත පදනම්ව, 2021/22 තක්සේරු වර්ෂය සඳහා 2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 56.86 ක් උපයන විට ගෙවිය යුතු බදු ලෙස සේවකයන්ගේ ඉපයීම්වලින් අඩු නොකර සේවකයන් වෙනුවෙන් බැංකුවේ අරමුදල්වලින් ගෙවා ඇත. | පහත සඳහන් කරුණු පෙන්වා දී ඇත.<br><br>අ) කැබිනට් තීරණයට අනුව, 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසින් සහ සියලුම භාණ්ඩාගාර සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලින් මහජන බැංකුව නිදහස් කර ඇත.<br><br>ආ) 2021 සිට 2023 දක්වා සහ 1991 සිට 1993 දක්වා කාලසීමාව/ වැටුප් චක්‍රයට අදාළව බැංකුව සහ වෘත්තීය සමිති අතර ඇති කර ගත් සාමූහික ගිවිසුම් අනුව.<br><br>මෙම සන්දර්භය තුළ, පහත සඳහන් කරුණු පෙන්ව දී ඇත.<br><br>අ) එහි පිළිවෙළින් 6 සහ 14 වගන්ති වෙත විශේෂ අවධානය යොමු කරන්න, එය ස්වයංව පැහැදිලි වේ. එය වැටුප් මතඋපයන විට ගෙවිය යුතු බදුවලට අදාළ අවසාන වගකීම දක්වයි.<br><br>ආ) ඉහත කී ගිවිසුම් දෙකෙහි (2) ස්වයංව පැහැදිලි වන පරිදි, මෙම පරිචය වසර තිහකට (30) ආසන්න කාලයක් පවතී.<br><br>ඇ) මීට සමාන සාමූහික ගිවිසුම් ලංකා බැංකුවේ සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේක්‍රියාත්මක වේ. ඕනෑම අනාගත සැකයක් දුරු කර ගැනීම සඳහාඅදාළ සියලු සාකච්ඡා සාමූහිකව සිදු කරයි.<br><br>ඈ) සියලුම බැංකු කාර්ය මණ්ඩලය සඳහා එකම ප්‍රතිලාභය අදාළ වේ. | පී.ඊ.ඩීචක්‍රලේඛය පිළිපැදිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 30,386.6 ක බදු පෙර ලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ අනුරූප ලාභය රු. මිලියන 21,226.7 ක් විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 9,159.9 ක් හෙවත් සියයට 43.15 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ශුද්ධ පොලී ආදායම, ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම සහ අනෙකුත් මෙහෙයුම් ආදායම්වල වැඩිවීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල විශ්ලේෂණයක් පසුගිය වර්ෂය සමඟ සසඳා, වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතයන් සහිතව පහත දැක්වේ.

| විස්තරය | විචලනය වැඩිවීම / (අඩු වීම) (රු.000) | විචලනය % | විචලනය සඳහා හේතුව |
|---|---|---|---|
| පොලී ආදායම | 17,612,485 | 9.8 | අයිරා, කාලීන ණය, මුදල් වෙළඳපොළ විදේශ මුදල් තැන්පතු,කෙටි කාලීන ණය සහආනයන ණයවල සාමාන්‍ය ශේෂය වැඩි වීම |
| පොලී වියදම | (3,914,573) | 3.3 | පොලී දරන වගකීම්වල සාමාන්‍ය ශේෂය වැඩි වුවද පොලී අනුපාත කප්පාදුව හේතුවෙන් අරමුදල්වල පිරිවැය අඩු වීම |
| වෙනත් වියදම් | 1,941,843 | 12.7 | පසුගිය වසරට සාපේක්ෂව වෙළඳ ප්‍රචාරණ සහ ව්‍යාපාර ප්‍රවර්ධනයේ වැඩි වීම, තැන්පතු රක්ෂණ වාරිකය සහ ක්ෂයවීම් වැඩිවීම. |
| හානිකරණ වියදම | 2,905,646 | 25.1 | ණය හා අත්තිකාරම් මත අතිරේක ප්‍රතිපාදන සහ ජත්‍යාන්තර ස්වෛරීත්ව බැඳුම්කර මත පැහැර හැරීමේ සම්භාවිතාව සියයට 30 ක් දක්වා වැඩි වීම. |
| මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු(VAT), ජාතිය ගොඩනැගීමේ බදු (NBT) සහ ණය ආපසුගෙවීම මත බදු(DRL) | 3,010,444 | 78.2 | ලාභ සහ වැටුප් වැඩිවීම |

| | | | |
|---|---|---|---|
| සේවක මණ්ඩල වියදම් | 3,049,568 | 15.5 | 2021-2023 සාමූහික ගිවිසුමට අනුව වැටුප් වැඩිවීම සහ දිරි දීමනා වැඩි කිරීම (2021 සඳහා මාස 2.5 ක් සහ 2020 සඳහා මාස 1 ක්) |

**2.3 අනුපාත විශ්ලේෂණය**

**ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ බැංකුවේ සමහර වැදගත් අනුපාත, ශ්‍රී ලංකා මහබැංකුව විසින් ප්‍රකාශිත ආංශික අනුපාත සමඟ සසඳා පහත දැක්වේ.**

| **විස්තරය** | **ආංශික අනුපාතය** | **බැංකුව 2021** | **2020** |
|---|---|---|---|
| **කාර්යසාධන අනුපාත** | | | |
| හිමිකම මත ප්‍රතිලාභය (ROE) | 13.8 | 19.9 | 14.3 |
| වත්කම් මත ප්‍රතිලාභය (ROA) | 1.6 | 1.3 | 1 |
| පොලී ආන්තිකය | 3.3 | 3.4 | 2.9 |
| **වත්කම් ගුණත්ව අනුපාතය** | | | |
| දළ අක්‍රිය ණය අත්තිකාරම් (NPL) | 4.3 | 3.2 | 3.3 |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත** | | | |
| ස්ථර 1 ප්‍රාග්ධනය (අවම 8.5%) | 13.2 | 12.6 | 9.5 |
| මුළු ප්‍රාග්ධනය (අවම 14%) | 16.7 | 17.8 | 15.5 |
| **ව්‍යවස්ථාපිත අනුපාත** | | | |
| ද්‍රවශීල වත්කම් අනුපාතය (අවම අවශ්‍යතාවය 20%) | 30.9 | 23.52 | 25.61 |
| ද්‍රවශීලතා ආවරණ අනුපාතය (අවම අවශ්‍යතාවය 100%) | | රුපියල් - 155.83 සියලු ව්‍යවහාර මුදල් – 105.71 | රුපියල් - 166.82 සියලු ව්‍යවහාර මුදල් - 111.55 |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ආර්ථික නොවන ගනුදෙනු**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **3.1.1 දත්ත ගබඩාව සහ ව්‍යාපාර බුද්ධි පද්ධති ව්‍යාපෘතිය**<br>බැංකුව විසින් 2011 වර්ෂයේදී දත්ත ගබඩා සහ ව්‍යාපාර බුද්ධි පද්ධතිය හඳුන්වා දීමට තීරණය කර තිබුණි. බැංකුව විසින් සැපයුම්කරුවන්ගෙන් අභිලාෂය ප්‍රකාශ කිරීම් | අදහස් සටහන් කරගෙන ඇත.<br><br>ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකළද, කොළඹ විශ්වවිද්‍යාලය සහ මොරටුව විශ්වවිද්‍යාලයෙන් සමන්විත බාහිර උපදේශක සහ තාක්ෂණික කමිටු | මෙම පද්ධතිය සඳහා බැංකුව පිරිවැයක් දරාඇතත්, දැනට බැංකුව එය මෙහෙයුම් සඳහා භාවිතා නොකරයි. බැංකුව මහජන මුදලින් ක්‍රියාත්මක වන බැවින් බැංකුවේ කළමනාකාරීත්ව තීරණ කිසිදු ව්‍යතිරේකයකින් තොරව |

(Expression of Interest) කැඳවා ලැයිස්තුගත කරන ලද සැපයුම්කරුවන්ගෙන් යෝජනා සඳහා වන ඉල්ලීම් (Request for Proposals) කැඳවා ඇතත් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබුණි. රු. 250,539,918 ක මූලික පිරිවැයකට ජස්ට් ඉන් ටයිම් තොරා ගැනීමේ තීරණය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. ඉදිරි වසර පහ සඳහා රු. 168,850,063 ක නඩත්තු වියදම් ඇතුළුව රු. 419,389,981 ක මුළු පිරිවැය සඳහා බැංකුව 2015 නොවැම්බර් 02 වන දින ජස්ට් ඉන් ටයිම් සමඟ ගිවිසුමකට එළඹ ඇත. ගිවිසුමේ සඳහන් අවසන් මිල ලේඛණයට අනුව බැංකුව එක්සත් ජනපද ඩොලර් සහ රුපියල් යන මුදල් දෙකෙන්ම මිල සඳහන් කර තිබුණද, එක්සත් ජනපද ඩොලර්ට සාපේක්ෂව රුපියලේ අගය අවප්‍රමාණය වීම හේතුවෙන් බැංකුවට රුපියල්වලින් එකඟ වූ මුදලට වඩා රු. 36,462,590 ක් වැඩිපුර ගෙවීමට සිදු විය. තවද, මූලික අදියරේදී අවශ්‍ය වෙනස්කම් හඳුනා නොගත් බැවින් එකඟ වූ පිරිවැයට අමතරව පද්ධතිය වෙනස් කිරීමේ ඉල්ලීම සඳහා රු. 1, 467,787.86 ක් ගෙවා ඇත. 2022 මැයි 30 වන විට බැංකුව රු. 405,757,212 (බදු ගෙවීමෙන් පසු) දරනු ලැබුවද, බලපත්‍රය කල් ඉකුත්වීම, වැඩි දියුණු කළ පද්ධතිවල (Upgraded systems) වෙනස්වීම් අනුව යාවත්කාලීන නොකිරීම, දත්ත ගබඩා පද්ධතිය භාවිතා කිරීම වෙනුවට දත්ත රැස් කිරීම සඳහා විකල්ප ක්‍රම භාවිත කිරීම සහ ඔවුන්ගේම ආකෘති සඳහා වාර්තා සකස් කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය නවතා දමා තිබූ අතර මෙහෙයුම් සඳහා එය භාවිත කළ නොතිබුණි.

සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව අනාගත ප්‍රවේශයක් ලෙස දත්ත ගබඩා ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.

ගිවිසුම්ගත වන විට එක්සත් ජනපද ඩොලරයක් රු. 133 ක් වූ අතර එය දැනට 3 ගුණයකින් පමණ වැඩි වී ඇති අතර එය ආසන්න වශයෙන් එක්සත් ජනපද ඩොලරයක්රු. 360 ක් වේ.

කාලයත් සමඟ අවශ්‍යතා වෙනස් වී නව අවශ්‍යතා ඇති විය. රු. 1,467,787.86 ක් වටිනා වෙනස් කිරීමේ ඉල්ලීම් දැනට අවශ්‍ය වන නව අවශ්‍යතා/වෙනස්කම් සඳහා ගෙවා ඇති අතර, වැරදි නිමවුමකින් බැංකුවට වටිනාකමක් නොමැත.

අඩුම මිල සහිත සහ අවශ්‍ය අනිවාර්ය/අවශ්‍ය මොඩියුල ඉදිරිපත් කිරීමේ සැපයුම්කරු ලෙස ඇගයීමක් මඟින් ජස්ට් ඉන් ටයිම් ටෙක්නොලොජීස් තෝරාගෙන ඇත.

මහජන බැංකුවේකළමනාකාරිත්වය සැපයුම්කරු සමඟ සාකච්ඡා කිරීමට සහ මිල සාකච්ඡා කිරීමට සහ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා ඊළඟ කාල සීමාව සඳහා බලපත්‍රය අලුත් කිරීම සහිතව හිතකර ගිවිසුමකට එළඹීමට පූර්ව විචාරී ක්‍රියාමාර්ග ගෙන ඇත. කෙසේ වෙතත්, සැපයුම්කරුගෙන් ලද යෝජනාව බැංකුව විසින් පිළි නොගත් අතර, එම නිසා බලපත්‍රය අලුත් කිරීමකින් තොරව බලපත්‍රය කල් ඉකුත්වීමෙන් පසු ව්‍යාපෘතිය නවතා දමා ඇත.

දත්ත ගබඩාවේ මෙම පරතරය සපුරාලීම සඳහා, නොයෙකුත් තොරතුරු පද්ධතිවලින් දත්ත ඒකාබද්ධ කිරීමට සහ නව මෘදුකාංගමෙවලමක් සමඟින් බැංකුවට වඩාත් ආර්ථිකමය විය යුතුය.

තමන්ගේම වාර්තා සහ උපකරණ පුවරු (dashboards)නිපදවීමට අභ්‍යන්තර විසඳුමක් සමඟ ඉදිරියට යාමට බැංකුව තීරණය කර ඇත. තෝරාගත් මෘදුකාංග මෙවලම එනම් 'Tableau' ඇගයීම සිදු වෙමින් පවතී. දත්ත ගබඩා විසඳුම සඳහා භාවිත කරන ලද තෝරාගත් සේවාදායක සංඛ්‍යාවක්, බැංකුවේ ප්‍රයෝජනය සඳහා නව සේවා මට්ටමේ ගිවිසුමක් (Service Level Agreement) සමඟ මෙම විසඳුම යටතේ නැවත භාවිත කිරීමට සැලසුම් කර ඇත.

## 3.2 හඳුනාගත්පාඩු

<table>
<tr><th>විගණන නිරීක්ෂණය</th><th>කළමනාකරණයේ අදහස් දැක්වීම</th><th>නිර්දේශය</th></tr>
<tr><td>
<table>
<tr><th></th><th colspan="3">2021</th><th colspan="3">2020</th></tr>
<tr><th>අලාභ සිදුවීම</th><th>සිදුවීම් සංඛ්‍යාව</th><th>වටිනාකම රු. මිලියන</th><th>මුළු වටිනාකමෙන් ප්‍රතිශතය</th><th>සිදුවීම් සංඛ්‍යාව</th><th>වටිනාකම රු. මිලියන</th><th>මුළු වටිනාකමෙන් ප්‍රතිශතය</th></tr>
<tr><td>අභ්‍යන්තර වංචා</td><td>4</td><td>52.64</td><td>23.48</td><td>1</td><td>0.43</td><td>0.06</td></tr>
<tr><td>බාහිර වංචා</td><td>100</td><td>121.07</td><td>54</td><td>181</td><td>735.50</td><td>95.50</td></tr>
<tr><td>ගනුදෙනුකරු, නිෂ්පාදන ව්‍යාපාර පරිචයන්</td><td>0</td><td>0</td><td>0</td><td>1</td><td>23.01</td><td>2.99</td></tr>
<tr><td>භෞතික වත්කම්වලට හානිවීම</td><td>6</td><td>0.37</td><td>0.17</td><td>4</td><td>0.51</td><td>0.07</td></tr>
<tr><td>ව්‍යාපාර බිඳවැටීම් හා පද්ධති අසාර්ථකතා</td><td>4</td><td>0.35</td><td>0.16</td><td>7</td><td>0.23</td><td>0.03</td></tr>
<tr><td>ක්‍රියාත්මක කිරීම, බෙදා හැරීම හා ක්‍රියාවලි කළමනාකරණය</td><td>103</td><td>49.79</td><td>22.21</td><td>96</td><td>10.50</td><td>1.36</td></tr>
<tr><td>එකතුව</td><td>217</td><td>224.22</td><td>100</td><td>290</td><td>770.18</td><td>100</td></tr>
</table>

➢ 2021 වර්ෂය සඳහා වාර්තා වූ මුළු පාඩුව රු. මිලියන 224.22 ක් වූ අතර එයට "බාහිර වංචා" සහ "අභ්‍යන්තර වංචා" යටතේ වර්ගීකරණය කර ඇති ප්‍රධාන
</td><td>
අවධාරණය කරන ලද සිදුවීම් සඳහා මූලිකහේතු විශ්ලේෂණයන් සිදු කර ඇති අතර අනාගතයේදී මෙවැනි සිදුවීම් වළක්වා ගැනීම/අවම කිරීම සඳහා වූ නිර්දේශ පිළිබඳව මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම්වලදී ගැඹුරින් සාකච්ඡා කර ඇත.

පහත විස්තර කර ඇති පරිදි වාර්තා වූ සිද්ධීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගෙන/ ආරම්භ කර ඇත.

<table>
<tr><th>සිද්ධිය</th><th>ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර</th></tr>
<tr><td>විවිධ සේවා සමුපකාර සමිතිය - මාතලේ</td><td>විමර්ශනය අවසන් කර ඇති අතර කාර්ය මණ්ඩල සාමාජිකයින් 07 දෙනෙකුට විනය තීරණ පනවමින් ඇත.</td></tr>
</table>
</td><td>අභ්‍යන්තර පාලන පද්ධති සමඟ අනුගතවීම අවශ්‍ය වේ.</td></tr>
</table>

| | | |
|---|---|---|
| වංචා තුනක් ඇතුළත් වන අතර ඒවා පිළිවෙලින් රු. මිලියන 40 ක්, රු. මිලියන 50.3 ක් සහ රු. මිලියන 50.23 ක් වේ.<br><br>➢ මාතලේ විවිධ සේවා සමුපකාර සමිතියට අදාළ මුදල් අවභාවිතය හා සම්බන්ධ රු. මිලියන 40ක එක් බාහිර වංචාවක් ඉහත සඳහන් වේ. සමිතියට අදාළ ස්ථාවර තැන්පතු 14ක් වසා දමා තිබූ අතර අදාළ මුදල්, ස්ථාවර තැන්පතුවලට අදාළ සාමාන්‍ය උපදෙස්වලට අනුව ගනුදෙනුකරුගේ ගිණුමට බැරකර හෝ "ආදායකයාගේ ගිණුමට" ගෙවුම් ඇණවුමක් නිකුත් කිරීමෙන් පමණක් ගෙවිය යුතු වුවත් ඊට පටහැනිව මුදලින් ගෙවා තිබුණි.මෙම සිදුවීම 2014 සහ 2015 වර්ෂවලදී වාර්තා වී ඇත.<br><br>➢ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ස්ථාවර තැන්පතු ගිණුමෙන් වංචා සහගත ලෙස මුදල් ආපසු ගැනීම සම්බන්ධ රු. මිලියන 50කතවත් බාහිර වංචාවක් සිදු විය. ස්ථාවර තැන්පතු 14 ක් වසා දමා තිබූ අතර අදාළ මුදල්, ස්ථාවර තැන්පතුවලට අදාළ සාමාන්‍ය උපදෙස්වලට අනුව ගනුදෙනුකරුගේ ගිණුමට බැර කර හෝ "ආදායකයාගේ ගිණුමට" ගෙවුම් ඇණවුමක් නිකුත් කිරීමෙන් පමණක් ගෙවිය යුතු වුවත් ඊට පටහැනිව මුදලින් ගෙවා තිබුණි.<br><br>➢ උකස් නිලධාරියා විසින් උකස් පද්ධතිය තුළ ව්‍යාජ ගනුදෙනුකරුවන් නිර්මාණය කරඋකස් අත්තිකාරම්වලින් සිදු කරන ලද රු. මිලියන 50.23 ක ප්‍රධාන අභ්‍යන්තර වංචාවක් හඳුනාගෙන ඇත. | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය: විමර්ශනය අවසන් කර ඇති අතර කාර්ය මණ්ඩල සාමාජිකයින් 08 දෙනෙකුට විනය තීරණ පනවමින් ඇත.<br><br>ගොනු අංක 8281/138/18 යටතේ - විමර්ශනය අවසන් කර කාර්ය මණ්ඩල සාමාජිකයින් 06 දෙනෙකුට විනය තීරණ පනවමින් ඇත.<br><br>**කොට්ටාව**: කෙටුම්පත් කරන ලද චෝදනා පත්‍ර 16 සඳහා නීති දෙපාර්තමේන්තුවේ අනුමැතිය බලාපොරොත්තු වෙන් සිටී.<br><br>හේතු දැක්වීමේ ලිපි 7 ක් නිකුත් කර ඇති අතරපිළිතුරු බලාපොරොත්තු වෙන් සිටී.<br><br>උසාවියේ නඩුව විභාග වෙමින් පවතී. ප්‍රධාන විත්තිකරුගේ වැඩ තහනම් කර ඇති අතර දැනට රිමාන්ඩ් භාරයේ පසුවේ.<br><br>ඉහත සඳහන් කරුණුවලට අමතරව, ප්‍රාදේශීය ශාඛාවන් තුළ සිදු කරනු ලබන කාලානුරූපී අවදානම් තක්සේරු කිරීම්වලදී පනවන ලද අභ්‍යන්තර පාලනයන් පිළිපැදීමේ මට්ටම තක්සේරු කරන ලෙස එක් එක් ප්‍රාදේශීය ශාඛාවේ ප්‍රාදේශීය අවදානම් නිලධාරි වෙත උපදෙස් ලබා දී ඇත. | |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

### 3.3.1. ඉදිකිරීම් ව්‍යාපෘතිවල ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **3.3.1.1**නියැදි සමාලෝචනයේදී ඉදිකිරීම් ව්‍යාපෘති නිම කිරීමේ සැලකිය යුතු ප්‍රමාදයන් පහත පරිදි නිරීක්ෂණය විය. | අදහස් සටහන් කර ගෙන ඇත. | ප්‍රමාදයන් අවම කිරීම අවශ්‍ය වේ. |

| ශාඛාවේ නම | කොන්ත්‍රාත්තුවේ ගොනු අංකය | පිරිවැය ඇස්තමේන්තුව (රු.) (බදු ගෙවීමට පෙර) | පිරිනැමීමේ දිනය | නිමකළ යුතු දිනය | 2021/12/31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | 2016/20 | 261,765,370 | 29/04/2016 | 15/02/2018 | 50%ක් සම්පූර්ණ කර ඇත. |
| යාපනය | 50/2017 | 784,713,362 | 09/05/2017 | 10/06/2019 | අවසන් නැත. |
| කෑගල්ල | PLPDL විසින් ටෙන්ඩරය කැඳවා ඇත. | 317,682,298 | 28/05/2019 | 27/01/2022 | 32% ක් සම්පූර්ණ කර ඇත. |
| මාතලේ | PLPDL විසින් ටෙන්ඩරය කැඳවා ඇත. | 330,813,315 | 8/10/2020 | 24/01/2022 | 40% සම්පූර්ණ කර ඇත. |

**3.3.1.2**ව්‍යාපෘතිවල නියැදි සමාලෝචනයේ දී ව්‍යාපෘති පිරිනැමීමේ දිනය සහ ඉදිකිරීම් ආරම්භක දිනය අතර සැලකිය යුතු ප්‍රමාදයන් පහත පරිදි නිරීක්ෂණය විය.

අදහස් සටහන් කර ඇත.

| ශාඛාවේ නම | කොන්ත්‍රාත්තුවේ ගොනු අංකය | පිරිවැය ඇස්තමේන්තුව (රු.) | පිරිනැමීමේ දිනය | ඉදිකිරීම් ආරම්භ කළ දිනය | ආරම්භ කිරීමට ප්‍රමාද වූ දින |
|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | 2016/20 | 261,765,370 | 29/04/2016 | 16/02/2017 | 293 |
| යාපනය | 50/2017 | 784,713,362 | 09/05/2017 | 07/12/2017 | 212 |
| කෑගල්ල | PLPDL විසින් ටෙන්ඩරය කැඳවා ඇත. | 317,682,298 | 28/05/2019 | 26/10/2020 | 517 |
| මාතලේ | PLPDL විසින් ටෙන්ඩරය කැඳවා ඇත. | 330,813,315 | 21/05/2019 | 22/10/2020 | 520 |
| මුලතිව් | PLPDL විසින් ටෙන්ඩරය කැඳවා ඇත. | 119,136,308 | 09/10/2017 | 08/03/2018 | 16 |

**3.3.1.3**2006 වර්ෂයේ අමාත්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාවය වැඩි දියුණු කිරීමට, ප්‍රමාදයන් අවම කිරීමට සහ ඉහළම මූල්‍යමය වශයෙන් වාසිදායක සහ උසස් තත්ත්වයේ වැඩ සහ සැපයුම් ලබා ගැනීමට යොදා ගැනේ. කෙසේ වෙතත්, බැංකුව මුදල් පනතෙන් නිදහස් කර ඇති බව ප්‍රකාශ කරමින් එම මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබුණු අතර බැංකුවේ වැඩ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සිදු කිරීමේදී ප්‍රසම්පාදන නියෝජිතායතනයක් විසින් අනුගමනය කළ යුතු බැංකුවට අදාළ වන ක්‍රියා පටිපාටියක් සංවර්ධනය කිරීමට බැංකුව අපොහොසත් වී තිබුණි. ඒ අනුව, 2017 සිට 2021 දක්වා කාලය තුළ ඇස්තමේන්තුගත වැඩ වටිනාකම වූ රු. මිලියන 7,092 කට අදාළ වැඩ 11 ක් සම්බන්ධයෙන් නිශ්චිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකර ප්‍රසම්පාදනයන් සිදු කර තිබුණි.

ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන මාර්ගෝපදේශ සහ ව්‍යාපෘති ප්‍රසම්පාදනය සඳහා වසර ගණනාවක් පුරා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) විසින් සකස් කරන ලද සම්මත ලංසු ලේඛන බැංකුව භාවිතා කර ඇත. තවද, බැංකුවට අදාළව වැඩ සහ උපදේශන සේවා සඳහා ප්‍රසම්පාදන ප්‍රතිපත්තියක් පසුව සංවර්ධනය කරන ලද අතර ඒ සඳහා 2022 ජුනි මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ඇත.

එබැවින්, බැංකුවට අදාළව වැඩ සහ උපදේශන සේවා සඳහා ප්‍රසම්පාදන අත්පොත සංවර්ධනය කරන තෙක් අවධාරණය කරන ලද ව්‍යාපෘති සඳහා ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය විසින් සංවර්ධනය කරන ලද සම්මත ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය බැංකුව අනුගමනය කර ඇති

බැංකුව විසින් ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන මාර්ගෝපදේශ අනුගමනය කර ඇති බව කළමනාකාරණයේ අදහස් දැක්වීමේ සඳහන් වුවද, ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන මාර්ගෝපදේශවලට අනුකූල නොවීම් කිහිපයක් නිරීක්ෂණය විය. එබැවින්, අනාගතයේදී බැංකුව 2022 ජුනි මාසයේදී අනුමත

යාපනයේ මහජන බැංකුවේ යෝජිත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය සහ ශාඛාව ඉදිකිරීම සඳහා 2013 වර්ෂයේදී රු. මිලියන 257.9 ක් වටිනා ඉඩමක් බැංකුව මිලදී ගෙන වසර 04 කට පසුව ලින්ක් ඉංජිනියරින් ප්‍රයිවට් ලිමිටඩ්වෙත දින 550 ක කාල සීමාවක් සහිතව රු. මිලියන 597.2 ක පිරිවැයකට යෝජිත ඉදි කිරීම පිරිනමා තිබුණද, වසර 8 ක් ගතවී ඇතත්

අපේක්ෂිත අරමුණ සපුරා ගැනීමට බැංකුව අපොහොසත් වී තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය අපේක්ෂිත දිනට නිම නොකිරීම හේතුවෙන් බැංකුව රු. මිලියන 13.12 ක් කාර්යාල කුලිය සහ ආරක්ෂක වියදම් ලෙස ආර්ථිකමය නොවන වියදම් දරා තිබුණි.

උපදේශකයින් තෝරා ගැනීම සහ බඳවා ගැනීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව සිදු කර නොතිබූ අතර ප්‍රසම්පාදන කටයුතු විනිවිදභාවයකින් සිදු කර නොතිබුණි. එයට උපදේශන කාර්යය පැවරීමට පෙර උපදේශන සමාගම (Design Group Five International (Pvt) Ltd) වැඩ ආරම්භ කර තිබීම සාක්ෂි සපයයි. මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් පරිපාලන සහ අධීක්ෂණ පිරිවැය රු. මිලියන 26.5 ක් හෙවත් ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැයෙන් සියයට 4.5 ක් විය. කොන්ත්‍රාත්තුවේ නියමයන්ට අනුව, කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘති කළමනාකරු සහ ඉංජිනේරුවන් ඇතුළුව තාක්ෂණික නිලධාරීන් 12 දෙනෙකු ව්‍යාපෘතිය සඳහා පූර්ණ කාලීනව සහ අර්ධකාලීනව සේවයේ යෙදවිය යුතුය. ඉදිකිරීම් අවසන් කරන ලද කොටසේ ඇති භෞතික දුර්වලතා සහ කොන්ත්‍රාත් පරිපාලනය සඳහා ගෙවන ලද ගෙවීම් සලකා බැලීමේදී නිලධාරීන් 12 දෙනා පූර්ණ කාලීනව හා අර්ධ කාලීනව සේවයේ යොදවා ඇති බව සහ ඔවුන් නිසි ලෙස අධීක්ෂණය කළේද යන්න පිළිබඳව සැකයක් පවතී.

තවද, මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් සැලසුම් කළ ප්‍රමාණයට වඩා විශාල ප්‍රමාදයන් පැවතීම, වැඩබිමේ බාධා කිරීම්, දෛනික සේවකයන්ගේ පැමිණීම අඩුවීම, සේවා ස්ථානයේ අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය හා භාණ්ඩ නොමැතිකම,ද්‍රව්‍ය සාම්පල හා තාක්ෂණික ඉදිරිපත් කිරීම් හිඟය, ප්‍රගති වාර්තා අනිසි ලෙස ඉදිරිපත් කිරීම සහ තීරු ප්‍රස්ථාර නිසි ලෙස ඉදිරිපත් කිරීමට නොහැකි වීම හේතුවෙන් කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කර තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව, උපදේශන ආයතනය තෝරා ගැනීම, ලංසු ලේඛන සකස් කිරීම, ලංසු ඇගයීම, කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම, කොන්ත්‍රාත්තු අවසන් කිරීම, කොන්ත්‍රාත් කටයුතු ක්‍රියාත්මක කිරීම, ඒවා අධීක්ෂණය කිරීම සහ උපදේශන සමාගම්වල වගකීම් ඉටු කිරීම යන කාර්යයන්හි දුර්වලතා මෙම කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත.

බැංකුව රු. මිලියන 204.84 ක් හෙවත් ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 27 ක් දරන ලද අතර විදේශ මුදල් අගය වෙනස් වීම සහ ද්‍රව්‍ය මිල ඉහළ යාම නිසා නිම නොකළ වැඩ සඳහා ඇස්තමේන්තුගත පිරිවැය වූ රු. මිලියන 659.08 ක් මුලින් රු. මිලියන 634.62 කට සංශෝධනය කර තිබුණු අතර නැවතත් එය රු. මිලියන 693.65 කට සංශෝධනය කර තිබුණි.

බව දන්වා සිටීමට කැමැත්තෙමු.

කලින් සඳහන් කළ පරිදි, මුලින් ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුවේ අනපේක්ෂිත දුර්වල ක්‍රියාකාරීත්වය හේතුවෙන් කොන්ත්‍රාත්තුව පසුව අවසන් වීම මෙන්ම 2020/2021 වර්ෂයේදී ඇති වූ කොවිඩ් 19 වසංගත තත්ත්වය යාපනයේ යෝජිත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය සහ ශාඛාව ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා ප්‍රමාදයට හේතු වූ අතර කොවිඩ් 19 වසංගත තත්ත්වය ප්‍රාග්ධන වියදම් ව්‍යාපෘති අඩු කිරීමටද හේතු විය.

කොන්ත්‍රාත් ව්‍යාපෘති උපදේශක අනුව කොන්ත්‍රාත්කරු විසින් අවශ්‍ය ව්‍යාපෘති අධීක්ෂණ කාර්ය මණ්ඩලය සපයා ඇතත්, පීපල්ස් ලීසිං ප්‍රොපටි ඩිවෙලොප්මන්ට්ස් සමාගම සහ බැංකුව ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල අඛණ්ඩ ප්‍රමාදයන් මෙන්ම ඉදිකිරීම් කටයුතුවල යම් දුෂ්කරතා සටහන් කර ගෙන ඇත. ව්‍යාපෘති උපදේශක වන පීපල්ස් ලීසිං ප්‍රොපටි ඩිවෙලොප්මන්ට්ස් සමාගමසහ බැංකුව ප්‍රමාදයන් මඟහරවා ගැනීමට මෙන්ම ඉදිකිරීම් කටයුතුවල ගුණාත්මකභාවය සහ ශිල්පීයත්වය පවත්වා ගැනීමට කොන්ත්‍රාත්කරුට අඛණ්ඩව උපදෙස් ලබා දී ඇත.

කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුගේ ප්‍රතිචාරය කිසිසේත් සතුටුදායක නොවූ අතර අවසානයේ ඔවුන්ගේ දුර්වල ක්‍රියාකාරිත්වය සලකා කොන්ත්‍රාත්තුව අවසන් කර ඇත. විගණන නිරීක්ෂණවල කරන ලද වැඩ සහ උපදේශන සේවා සඳහා වන සිය ප්‍රසම්පාදන ප්‍රතිපත්තියට අනුකූල විය යුතුය.

| | | |
|---|---|---|
| | සඳහන් කර ඇති පරිදි, කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් කොන්ත්‍රාත්තුව අවසන් වූ පසු, ව්‍යාපෘති උපදේශක විසින් ටෙන්ඩර් ලේඛනය සහ ව්‍යාපෘතියේ ඉතිරි වැඩ සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව සකස් කර ඇත. ව්‍යාපෘතියේ සම්පූර්ණ වැඩ කොටස ආවරණය කිරීම සඳහා බාහිර වැඩවලට අදාළ අමතර වැඩ කොටස සහ ඇතැම් අනුමාන ක්‍රියාකාරකම් ඇතුළුව ඉතිරි වැඩ කොටස නැවත සංශෝධනය කර ඇත.<br><br>තවද, ද්‍රව්‍ය, ශ්‍රමය, කම්හල්වල මිල වැඩිවීම හේතුවෙන් ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොටස සම්පූර්ණ කිරීමට අදාළ අමතර පිරිවැය පසුව මුල් කොන්ත්‍රාත්කරුගේ රු. මිලියන 59.72 ක් වූ කාර්යසාධන බැඳුම්කරය මුදල් කිරීමෙන් අයකර ගැනීමට හැකි වේ. යාපනයේ යෝජිත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාල සහ ශාඛා ගොඩනැඟිල්ලේ ඉතිරි වැඩ අවසන් කිරීමේ කොන්ත්‍රාත්තුව 2022 මැයි මාසයේදී ප්‍රදානය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතර ඒ අනුව 2022 ජුනි මාසයේදී සන්කෙන් ඉදිකිරීම් පුද්ගලික සමාගම වෙත කොන්ත්‍රාත්තුව ලබා දී ඇත. යෝජිත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාල සහ ශාඛා ගොඩනැඟිල්ලේ ඉතිරි වැඩ ඉදි කිරීම සිදු වෙමින් පවතී. | |

**3.4 ණය පරිපාලනය**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **3.4.1** | බැංකුව 2021 වර්ෂය තුළදී එකතුව රු. මිලියන 778,056.37 ක් වන | අදහස් සටහන් කර ගෙන ඇත. | අක්‍රිය ණය |

ණය ප්‍රදානය කර තිබූ අතර ඉන් රු. මිලියන 12,239.40 ක් 2021 දෙසැම්බර් 31 දිනට අක්‍රීය ණය ගණයට මාරු කර තිබුණි. එම අක්‍රීය ණය අතරින් රු. මිලියන 1,015.83 ක් වූ ණයවලට අදාළව එක වාරිකයක් හෝ අය කර නොතිබුණි. එයින් රු. මිලියන 987.89 ක් වූ ණයවලට අදාළව එක් ප්‍රාග්ධන වාරිකයක් හෝ එමෙන්ම රු. මිලියන 27.94 ක් වූ ණයවලට අදාළ කිසියම් පොලියක් හෝ 2021 දෙසැම්බර් 31 දිනට අයකරගෙන නොතිබුණි.

අයකර ගැනීම් සම්බන්ධයෙන් අඛණ්ඩ පසුවිපරම් කිරීම් අවශ්‍ය වේ.

**3.4.2.** බැංකුවේ අක්‍රීය ණය අනුපාතය පසුගිය වසර පහ තුළ පහත පරිදි අඛණ්ඩව ඉහළ ගොස් ඇත.

| වර්ෂය | **2017** | **2018** | **2019** | **2020** | **2021** |
|---|---|---|---|---|---|
| අක්‍රීය ණය අනුපාතය **%** | 1.9 | 2.5 | 3.3 | 3.2 | 3.2 |

පසුගිය වසර 05 තුළ දළ අක්රීය ණය අනුපාතය සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති බව පිළිගත හැකිය. 2017 - 2018 වසර තුළ සුළු වැඩිවීමක් නිරීක්ෂණය කළ හැකිය. කෙසේ වෙතත්, පාස්කු ප්‍රහාරයේ ප්‍රතිඵලයක් ලෙස ඇති වූ ආර්ථික අර්බුදය සහ ඉන් පසුව ඇති වූ බලපෑම් හේතුවෙන් සැලකිය යුතු වර්ධනයක් දැකිය හැකිය. කෙසේ වෙතත්, එම තත්ත්වය වළක්වා සාමාන්‍ය තත්ත්වයට පත්කිරීම සඳහා ශක්තිමත් අයකර ගැනීමේ මෙහෙයුමක් ආරම්භ කර ඇත.

අක්‍රීය ණය අයකර ගැනීම් සම්බන්ධයෙන් අඛණ්ඩ පසුවිපරම් කිරීම් අවශ්‍ය වේ.

**3.4.3.** 2017 සිට 2021 දක්වා පසුගිය වසර පහ තුළ කපා හරින ලද අත්තිකාරම් සහ කපා හරින ලද අත්තිකාරම්වලින් අයකර ගත් මුදල් පිළිබඳ විශ්ලේෂණය පහත පරිදි වේ.

| **වර්ෂය** | **කපා හරින ලද මුදල (රු. මිලියන)** | **අයකරගත් මුදල (රු. මිලියන)** | **කපා හරින ලද මුදලට එරෙහිව අයකරගත් මුදලේ ප්‍රතිශතය** |
|---|---|---|---|
| 2017 | 102.14 | 30.29 | 29.66% |
| 2018 | 42.35 | 25.96 | 61.30% |
| 2019 | 219.66 | 71.53 | 32.56% |
| 2020 | 195.70 | 13.57 | 6.93% |
| 2021 | 119 | 15.29 | 12.85% |
| **එකතුව** | **750.85** | **156.64** | **20.86%** |

ගිණුම් පොත් නිසි ලෙස පිළිබිඹු කිරීමේ අරමුණින් බැංකුව සෑම වසරකම අදාළ වන පරිදි ආපසු අයකරගත නොහැකි අක්‍රීය ණය සඳහා කපා හැරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කර ඇත. එවැනි කපා හැරීමේ අත්තිකාරම් ආපසු අයකර ගැනීමට හැකි සෑම අයකර ගැනීමේ ක්‍රියාමාර්ගයක්ම අඛණ්ඩව කරගෙන ගොස් ඇත.
තවද, කපා හැරීමේ ණය ආපසු අයකර ගැනීම අයකර ගැනීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය සාධන දර්ශකයක් ලෙස සකසා ඇති අතර අයකර ගැනීමේ ක්‍රියාවලියේ සඵලතාවය සහතික කිරීම සඳහා මාසික පදනමින් සමීපව අධීක්ෂණය කරයි.

ණය අයකර ගැනීම් පිළිබඳ අඛණ්ඩ පසු විපරම් කිරීම් අවශ්‍ය වේ.

**3.4.4.** 2021 දෙසැම්බර් 31 දිනට ඉහළම අක්‍රීය ණය 10 හි මුළු හිඟය රු. මිලියන 53,741.75 ක් වූ අතර එහි ප්‍රාග්ධන කොටස රු. මිලියන 28,658.73 ක් සහ පොලී කොටස රු. මිලියන 25,083.04 ක් වූ අතර එය මුළු දළ අක්‍රීය ණය සහ අත්තිකාරම්වලින් සියයට 47.8 ක් නියෝජනය කරයි. එයින් රු. මිලියන 30,627 කට හෙවත් ඉහත අත්තිකාරම්වලින් සියයට 51.1 කට සුරැකුම් නොමැති අතර රු. මිලියන 3,182 කට හෙවත් ඉහත අත්තිකාරම්වලින් සියයට 5.31 කට ප්‍රමාණවත් සුරැකුම් නොමැත.

අදහස් සටහන් කර ගෙන ඇත.

ණය අයකර ගැනීම් පිළිබඳ අඛණ්ඩ පසු විපරම් කිරීම් අවශ්‍ය වේ.

| | ගනුදෙනුකරුගේ නම | ප්‍රාග්ධන ශේෂය රු. මිලියන | පොලී ශේෂය රු. මිලියන | මුළු ශේෂය රු. මිලියන |
|---|---|---|---|---|
| 01 | සමුපකාර තොග ආයතනය | 5,239.64 | 203.55 | 5,443.19 |
| 02 | CML සමූහය | 3,472.54 | 1,555.51 | 5,028.05 |
| 03 | ද ග්‍රෑන්ඩ් මවුන්ටන් හෝටලය (පුද්ගලික) සමාගම | 3,450.64 | 234.67 | 3,685.31 |
| 04 | සීමාසහිත ඩබ්ලිව් එම් මෙන්ඩිස් සහ සමාගම | 3,136.60 | 106.15 | 3,242.75 |
| 05 | යශෝධා සමූහය | 3,040.41 | 21,731.13 | 24,771.5 |
| 06 | SREI උපකරණ මූල්‍ය සමාගම | 3,011.25 | 162.26 | 3,173.51 |
| 07 | මිහින් ලංකා (පුද්ගලික) සමාගම | 2,564.71 | 1.55 | 2,566.26 |
| 08 | හුරාවී ඉන්ටනැෂනල් (පුද්ගලික) සමාගම | 1,907.13 | 614.09 | 2,521.22 |
| 09 | දයා ඇපරල් සමූහය | 1,460.24 | 407.36 | 1,867.60 |
| 10 | නවලෝක සමූහය | 1,375.57 | 66.75 | 1,442.32 |
| | **එකතුව** | **28,658.73** | **25,083.02** | **53,741.7** |

**3.4.5.** පසුගිය වසර 5 සඳහා ඉහළමඅක්‍රීය ණය ගනුදෙනුකරුවන්10 දෙනා සහ ශේෂයන් පිළිබඳ විශ්ලේෂණය පහත පරිදි වේ.

**රු. මිලියන**

| ගනුදෙනුකරුගේ නම | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| යශෝධා සමූහය | 21,635. | 22,416. | 23,197.6 | 23,980. | 24,771. |
| CML MTD සමූහය | | 2,746.6 | 4,041.3 | 4,680 | 5,028.0 |
| මිහින් ලංකා (පුද්ගලික) සමාගම | | 2,578.6 | 2,868.3 | 2,502 | 2,566.2 |
| සීමාසහිත ඩබ්ලිව් එම් මෙන්ඩිස් සහ සමාගම | | | 2,674.6 | 3,875.7 | 3,242.7 |
| හුරාවී ඉන්ටනැෂනල් (පුද්ගලික) සමාගම | | | 1,926.6 | 2,178.8 | 2,521.2 |
| දයා ඇපරල් සමූහය | | | 785.5 | 1,943.2 | 1,867.6 |
| නවලෝක සමූහය | | | 570.28 | 1,699.2 | 1,442.3 |
| ගුඩ් ෆෙලෝස් (පෞද්ගලික) සමාගම | 1,387.9 | 1,704.9 | 1,742.6 | 1,905.2 | |
| රිකන් ලංකා (පුද්ගලික) සමාගම | 1,636.3 | 2,025.3 | 1,937.5 | | |
| ශ්‍රේලයින් එක්ස්ප්‍රස් (පුද්ගලික) සමාගම | 4,609.3 | 4,714.6 | | | |

2017 – 2021 කාලය තුළදී ඉහළම අක්‍රීය ණය ශේෂයන් 10 ප්‍රධාන වශයෙන් විදේශ මුදල් අගය ඉහළ යාම හේතුවෙන් ඉහළ ගොස් ඇත. සමුපකාර තොග වෙළඳ ආයතනය, CML MTD සමූහය, මිහින් ලංකා, දයා ඇපරල් සමූහය, නවලෝක සමූහය විසින් ලබා ගත් ණය මුදලේ ප්‍රාග්ධන කොටසින් කොටසක් සමුච්චිත පොළිය සමඟ මෙම කාල සීමාව තුළදී අයකරගෙන ඇත. ඉතිරි අක්‍රීය ණය අයකර ගැනීම සඳහා ආක්‍රමණශීලී අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.

ණය අයකර ගැනීම් පිළිබඳ අඛණ්ඩ පසු විපරම් කිරීම් අවශ්‍ය වේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| ද ග්‍රෑන්ඩ් මවුන්ටන් හෝටලය (පුද්ගලික) සමාගම | | 447.2 | | 3,563.9 | 3,685.3 |
| සිටි කන්ස්ට්‍රක්ෂන් කන්ට්‍රැක්ටර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 973.1 | 861.3 | | 1,036.4 | |
| ඊ.ඩබ්ලිව්තොරතුරු පද්ධති සමාගම | 1,022.4 | 1,122.1 | | | |
| රුසිරුමල් (පුද්ගලික) සමාගම | 431.5 | | | | |
| රුහුණු සංවර්ධන කොන්ත්‍රාත්කරුවන් සහ ඉංජිනේරුවන් | 323.5 | | | | |
| කොටගල වැවිලි | 271.9 | | | | |
| ටෙක් ඉන්පොමේෂන් සෝලුෂන් ප්‍රයිවට් ලිමිටඩ් | 162.7 | | | | |
| ලංකා සිලෝන් පීඑල්සී | | 683.4 | | | |
| ලන්කෙම් සිලෝන් පීඑල්සී | | | 851.6 | | |
| සමුපකාර තොග වෙළඳ ආයතනය | | | | | 5,443.1 |
| SREIඋපකරණ මූල්‍ය සමාගම | | | | | 3,173.5 |
| **එකතුව** | **32,454.** | **39,300.** | **40,595.7** | **47,365.** | **54,741.** |
| | | | | | |
| පෙර වසර හා සසඳන විට ඉහළම අක්‍රීය ණය 10 හි වැඩි වීම (වටිනාකම) | | 6,846.3 | 1,295.04 | 6,769.3 | 7,156.2 |
| පෙර වසර හා සසඳන විට ඉහළම අක්‍රීය ණය 10 හි වැඩි වීම (%) | | 21.1% | 3.3% | 16.7% | 15.1% |

- **2**021 වන විට, 2017ට සාපේක්ෂව ඉහළම අක්‍රීය ණයශේෂ 10 සියයට68.67කින් හෙවත් රු. මිලියන 22,287.35කින් වැඩි විය.

- ඉහත විශ්ලේෂණය අනුව, යශෝදා සමූහය පසුගිය වසර පහ පුරාවට ඉහළම අක්‍රීය ණය ගැණුම්කරුවන් 10 දෙනා අතර අඛණ්ඩව රැඳී සිටියි. CML MTDසමූහය, මිහින් ලංකා (පුද්ගලික) සමාගමසහ සීමාසහිත ඩබ්ලිව්එම් මෙන්ඩිස් සහ සමාගම, හුරාවී ඉන්ටනැෂනල් (පුද්ගලික) සමාගම, දයා ඇපරල් සමූහයසහ නවලෝක සමූහය පසුගිය වසර තුන තිස්සේ අඛණ්ඩව ඉහළම අක්‍රීය ණය 10 අතර සිටී. සමුපකාර තොග වෙළඳ ආයතනයසහ SREI **උපකරණ මූල්‍ය සමාගම** 2021 වර්ෂය තුළදීඉහළම අක්‍රීය ණය 10 ට අලුතින් එක් වී ඇත.

**3.4.6.** රජයේ නිරාවරණය - පසුගිය වසර 5 හි සාරාංශය

රාජ්‍ය ව්‍යවසායන්ට (SOEs) අයත් ණය සහ අත්තිකාරම්වල සම්පූර්ණ හිඟ ශේෂය පසුගිය වසර පහ තුළදී සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. 2021 වන විට, 2017 වසරට සාපේක්ෂව SOEs හි සතු මුළු හිඟ ණය සහ අත්තිකාරම් සියයට 165 කින් හෙවත් රු. මිලියන 584,107 වැඩි වී ඇත. 2018,2019,2020 සහ 2021 වසරවල වාර්ෂික වර්ධනය පෙර වසරට සාපේක්ෂව පිළිවෙලින් සියයට 56 ක්, සියයට 9.11 ක්, සියයට 40.55ක් සහ සියයට 10.96 ක් විය. 2017 වර්ෂයේදී, SOEs හි මුළු හිඟ ශේෂය මුළු ණය සහ අත්තිකාරම්වලින් සියයට 32.89 ක් සහ බැංකුවේ මුළු වත්කම්වලින් සියයට 24.08 ක් විය.

මෙම ප්‍රතිශත 2021 දෙසැම්බර් 31 දිනට මුළු ණය සහ අත්තිකාරම්වලින් සියයට 48.39ක් සහ මුළු වත්කම්වලින් සියයට 35.40ක් දක්වා වේගයෙන් වර්ධනය විය. බැංකුවේ මුළු වත්කම් පදනම 2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 2,647,641 දක්වා ඉහළ ගියද, සියයට 35.40ක් සහ සියයට 25.39ක් පිළිවෙලින් SOEs හි "ණය සහ අත්තිකාරම්වලින්"සහ "රජයෙන් ලැබිය යුතු ආයෝජන හාඅනෙකුත් ලැබිය යුතු මුදල්වලින්" නියෝජනය වේ. ඒ අනුව, බැංකුවේ වත්කම් පිළිබඳ රජයේ මුළු නිරාවරණය දළ වශයෙන් සියයට 60.79ක් නියෝජනය කරයි. බැංකුව විසින් රජයට ගෙවිය යුතු මුළු මුදල (ණය ගැනීම්, තැන්පතු සහ ස්කන්ධය) රු. මිලියන 362,799 ක් වූ අතර එය මුළු වත්කම්වලින් සියයට 13.70 ක් නියෝජනය කරයි.

| | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| SOEs වලට අයත් ණය සහ අත්තිකාරම් | 353,279 | 551,110 | 601,297 | 844,821 | 937,386 |
| පෙර වසරට සාපේක්ෂව SOEs හි ශේෂය වැඩි වීම | | 197,821 | 50,197 | 243,525 | 92,564 |
| පෙර වසරට සාපේක්ෂව SOEsහි ශේෂයේ වැඩිවීම (%) | | 56.00 | 9.11 | 40.55 | 10.96 |
| මුළු ණය හා අත්තිකාරම් | 1,074,248 | 1,334,420 | 1,386,481 | 1,723,466 | 1,936,974 |
| බැංකුවේ මුළු ණය සහ අත්තිකාරම් වලින් SOEsහි ණය ශේෂය (%) | 32.89 | 41.30 | 43.37 | 49.02 | 48.39 |
| මුළු බැංකුවේ වත්කම් | 1,467,099 | 1,734,703 | 1,873,406 | 2,230,119 | 2,647,641 |
| මුළු වත්කම් වලින් SOEs හි ණය ශේෂය (%) | 24.08 | 31.77 | 32.10 | 37.88 | 35.40 |
| රජයෙන් ලැබිය යුතු ආයෝජන හා අනෙකුත් ලැබිය යුතු මුදල් | 278,676 | 328,158 | 419,217 | 435,343 | 672,155 |
| SOEsහි සම්පූර්ණ වත්කම් නිරාවරණය | 631,954 | 879,257 | 1,020,514 | 1,280,164 | 1,609,540 |
| මුළු වත්කම් වලින් SOEs නිරාවරණය (%) | 43.08 | 50.69 | 54.47 | 57.40 | 60.79 |
| SOEsවෙත ගෙවිය යුතු මුළු එකතුව (ණය ගැනීම් සහ තැන්පතු) | 182,559 | 271,085 | 217,791 | 222,257 | 226,722 |
| ස්කන්ධය | | | | | 136,077 |

සටහන් කර ගෙන ඇත.

නිසි සීමාවන් පවත්වා ගනිමින් SOEsහි ණය ශේෂයන් පිළිබඳ පසු විපරම් කිරීම අවශ්‍ය වේ.

**3.4.7** 2021 දෙසැම්බර් 31 දිනට ඉහළම SOEs 10 හි ණය රු. මිලියන 882,840 ක් වූ අතර එහි ප්‍රාග්ධන කොටස රු. මිලියන 873,689 ක් සහ පොලී කොටස රු. මිලියන 9,152 ක් විය. එය SOEs අයත් ණය සහ අත්තිකාරම්වල මුළු හිඟ ශේෂයෙන් සියයට 94.18 ක් නියෝජනය කරයි. ඉහළම SOEs ණය දහයේ විස්තර පහත පරිදි වේ.

| ආයතනය | **2021 දෙසැම්බර් 31** දිනට හිඟ ශේෂය රු. මිලියන | සුරැකුම | **සුරැකුම් වටිනාකම** |
|---|---|---|---|
| භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් | 373,918 | සුරැකුම් රහිත | - |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 233,395 | භාණ්ඩාගාරහානි රක්ෂණය | එ.ජ.ඩො මිලියන 1,657 |
| ලංකා විදුලිබල මණ්ඩලය | 70,004 | භාණ්ඩාගාර ඇපකරය | රු. මිලියන 20,350.08 |
| | | ලැබිය යුතු දැවලට එරෙහිව උගස්කරය | රු. මිලියන 38,800 |
| | | සුරැකුම් රහිත (රු. මිලියන 29,835) | - |
| මාර්ග සංවර්ධන අධිකාරිය | 65,803 | භාණ්ඩාගාර ඇපකරය | රු. මිලියන 35,000 |
| | | | එ.ජ.ඩො මිලියන 44.7 |
| | | භාණ්ඩාගාර හානි රක්ෂණය | රු. මිලියන 8,380.09 |
| | | භාණ්ඩාගාර භාර ගැනීමේ ලිපිය | රු. මිලියන 12,892.87 |
| | | මුදල් තැන්පතු පැවරීම | රු. බිලියන 1.07 |
| ශ්‍රී ලංකන් ගුවන් සේවය | 43,252 | භාණ්ඩාගාර ඇපකරය | රු. මිලියන 13,901.84 |
| | | | එ.ජ.ඩො මිලියන 12.89 |
| | | භාණ්ඩාගාර සහන ලිපිය | රු. මිලියන 13,901.84 |
| | | | එ.ජ.ඩො මිලියන 101.87 |
| ලංකා පොහොර සමාගම | 27,052 | භාණ්ඩාගාර සහන ලිපිය | රු. මිලියන 27,147.05 |
| | | ස්ථාවර තැන්පතු | රු. මිලියන 1,393.8 |
| අධ්‍යක්ෂ විශ්‍රාම වැටුප් | 23,463 | භාණ්ඩාගාර ඇපකරය | රු. මිලියන 32,467 |
| කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 16,978 | භාණ්ඩාගාර සහන ලිපිය | රු. මිලියන 10,325.75 |
| | | | එ.ජ.ඩො මිලියන 40.28 |
| | | මුදල් පැවරීම | රු. මිලියන 122.18 |

අදහස් සටහන් කර ගෙන ඇත. බැංකුව SOEsනිරාවරණ සඳහා සීමාවන් නියම කර ඇති අතර 2023 දී SOEsනිරාවරණය ක්‍රමයෙන් අඩු කිරීමට පියවර ගනිමින් සිටී.

භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේනිරාවරණය සම්බන්ධයෙන් පහත කරුණු අවධාරණය කෙරේ.

- භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේගිණුම සඳහා 2021.12.31 දිනට රු. බිලියන 373.918 ක අයිරා සීමාවක් අනුමත කර ඇත. කෙසේ වෙතත්, එය දැනට රු. බිලියන 30.0ක් දක්වා අඩු වී ඇත. 2022.09.02 දිනැති අංක. PB/CEO/GM/RK/HOF දරනලිපියට අනුව,2022.09.30 දින සිට ක්‍රියාත්මක වන පරිදි අයිරා ශේෂය රු. බිලියන 15.0ක් දක්වා තවදුරටත් අඩු කරන ලෙස බැංකුව ඉල්ලා ඇත.

- කෙසේ වෙතත්, 2022.09.30 දිනැති අංක. TOD/FOA/01/PB/GEN දරන මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේලිපිය අනුව, භාණ්ඩාගාර ලේකම් (වැඩබලන) දැනට පවතින අයිරා සීමාව වන රු. බිලියන 30.0,2022 දෙසැම්බර් අවසානය දක්වා පවත්වා ගන්නා ලෙස ඉල්ලා ඇත.

නිසි සීමාවන් පවත්වා ගනිමින් SOEsහි ණය ශේෂයන් පිළිබඳ පසු විපරම් කිරීම් අවශ්‍ය වේ.

| | | | |
|---|---|---|---|
| ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය | 14,918 | භාණ්ඩාගාර ඇපකරය | රු. මිලියන 3,961.03<br>යුරෝ මිලියන 7,6 |
| | | භාණ්ඩාගාර භාර ගැනීමේ ලිපිය | රු.මිලියන 11,295.92 |
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | 14,057 | භාණ්ඩාගාර සහන ලිපිය | රු. මිලියන 6,000 |
| | | සුරැකුම් රහිත (රු. මිලියන 8,000) | - |

3.4.8 භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ හිඟ ශේෂයන්, සමෘද්ධි ණය සහ රජයේ භාණ්ඩාගාරයෙන් ජොෂ්ඨ පුරවැසි තැන්පතුවලට අදාළව ලැබිය යුතු පොලී ශේෂය වූ රු. මිලියන 480,526 ක් මුදල් ගෙවීමෙන් පියවීම වෙනුවට 2020 සහ 2021 වර්ෂ තුළදී භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම මඟින් පියවා ඇත.

අදහස් සටහන් කර ගෙන ඇත.

මුදල් මගින් පියවීම් ලබා ගැනීමට අවධානය යොමු කළ යුතුය.

| | 2020 | 2021 | හිලව් කරන ලද මුළු මුදල |
|---|---|---|---|
| භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් | 201,611 | 257,000 | 458,611 |
| සමෘද්ධි ණය | - | 3,582 | 3,582 |
| ජොෂ්ඨ පුරවැසි තැන්පතු සඳහා ලැබිය යුතු පොලී | 10,956 | 7,376 | 18,332 |
| එකතුව | | | **480,526** |

**. මිලියන**

3.4.9 2021 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යවසායන්ට අයත්ශේෂ පත්‍රයෙන් බැහැර වටිනාකම (ණයවර ලිපි සහ බැංකු ඇපකර) රු. මිලියන 120,663 ක් වූ අතර, ඉහත කී ශේෂ පත්‍රයෙන් බැහැර වටිනාකම ඇතුළුව SOEs නිරාවරණය රු. මිලියන 1,730,203 ක් වූ අතර එය බැංකුවේ මුළු වත්කම්වලින් සියයට 65.35 ක් විය. තවද, රු. මිලියන 93,378 ක් හෙවත් ශේෂ පත්‍රයෙන් බැහැර වටිනාකමින් සියයට 77.39 ක් ලංකා ඛනිජ තෙල් සංස්ථාව වෙනුවෙන් විවෘත කරන ලද ණයවර ලිපි නියෝජනය කරයි.

අදහස් සටහන් කර ගෙන ඇත. බැංකුවේ උග්‍ර එක්සත් ජනපද ඩොලර් තත්ත්වය හේතුවෙන්, අපි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත නව ණයවර ලිපි නිකුත් කර නොමැත, එබැවින් 2022.11.17 දිනට හිඟ ණයවර ලිපි නොමැත. කෙසේ වෙතත්, නොපියවූ භාවිත බිල්පත් (Usance Bill) වටිනාකම වූ රු. බිලියන 74.74 ක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේහි ශේෂයෙන් බැහැර අයිතමයක් ලෙස පවතී.

නිසි සීමාවන් පවත්වා ගනිමින් SOEs හි සීමාවන් පිළිබඳ පසු විපරම් කිරීම් අවශ්‍ය වේ.

3.4.10 එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අවප්‍රමාණය වුවද, පහත වගුවේ පරිදි 2021 වසර තුළදී එක්සත් ජනපද ඩොලර් මිලදී ගැනීම සඳහා බැංකුව එක්සත් ජනපද ඩොලර්/රුපියල් හුවමාරු (Swaps)ගිවිසුම් රාශියකට එළැඹ ඇති අතර එක්සත් ජනපද ඩොලරයේ විකුණුම් අනුපාතය බොහෝ අවස්ථාවලදී එක්සත් ජනපද ඩොලරයේ මිලදී ගැනීමේ අනුපාතයට වඩා අඩු බව නිරීක්ෂණය විය. එබැවින්, 2021 වර්ෂය තුළදී හුවමාරු ගිවිසුම් මත බැංකුව රු. 4,063,085,606 ක (පරිණත වන දිනට (far leg) සත්‍ය අනුපාතය ගැලපීමකින් තොරව) අලාභයක් දරා තිබුණි.

පහත සඳහන් සාධක හේතුවෙන් එක්සත් ජනපද ඩොලර් අරමුදල් සපයා ගැනීම සඳහා එක්සත් ජනපද ඩොලර්/රුපියල් හුවමාරු ගනුදෙනුවලට ඇතුල් වීමට බැංකුවට සිදු විය.
2020 සහ 2021 වසරවල රටේ ශ්‍රේණිගත කිරීම අඛණ්ඩව පහත හෙලීමේ ප්‍රතිඵලයක් ලෙස, විදේශ බැංකු සහ මූල්‍ය ආයතන මහජන බැංකුව ඇතුළු ශ්‍රී ලංකාවේ කිසිදු

නව ණයවර ලිපිවිවෘත කිරීමේදී විදේශ විනිමය තත්ත්වය පිළිබඳව වැඩි සැලකිල්ලක් දැක්වීම අවශ්‍ය වේ.

එ.ජ.ඩො /රුපියල් (මිළදී ගැනීම) හුවමාරු (Swaps) 2021

| **පළමු කාර්තුව එ.ජ.ඩො** | **දෙවන කාර්තුව එ.ජ.ඩො** | **තුන්වන කාර්තුව එ.ජ.ඩො** | **හතරවන කාර්තුව එ.ජ.ඩො** | **එකතුව එ.ජ.ඩො** |
|---|---|---|---|---|
| 776,210,000 | 616,750,000 | 281,255,036 | 634,440,814 | 2,308,655,850 |

බැංකුවකට එක්සත් ජනපද ඩොලර් පහසුකම් ලබා දීමෙන් වැළකී ඇත. 2020 දෙසැම්බර් 31 වන දින වන විට අපගේ එක්සත් ජනපද ඩොලර් ණය ගැනීම් එක්සත් ජනපද ඩොලර් මිලියන 857.2 කි. කෙසේ වෙතත්, 2021 දෙසැම්බර් 31 වන විට මෙම අගය එක්සත් ජනපද ඩොලර් මිලියන 481.75 ක් පමණි.

තවද, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සඳහා නව ණයවර ලිපි විවෘත කිරීම, අන්තර් බැංකු විදේශ විනිමය වෙළඳපොලෙන් එක්සත් ජනපද ඩොලර් මිලදී ගැනීමට නොහැකි වීම සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හිඟ එක්සත් ජනපද ඩොලර් වටිනාකම පියවීම සඳහා මෙම එක්සත් ජනපද ඩොලර් භාවිතා කිරීම හේතුවෙන්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හිඟ එක්සත් ජනපද ඩොලර් වටිනාකම 2021 වසර තුළදී එක්සත් ජනපද ඩොලර් මිලියන 76.3 කින් වැඩි විය.

බැංකුවේ එක්සත් ජනපද ඩොලර් ද්‍රවශීලතා හිඟය පියවා ගැනීමට බැංකුවට ඇති එකම විකල්පය එක්සත් ජනපද ඩොලර්/රුපියල් හුවමාරු ගනුදෙනුවලට ඇතුල් වීම වූ අතර එක්සත් ජනපද ඩොලර් වගකීම් පියවීම සඳහා එම එක්සත් ජනපද ඩොලර් අරමුදල් භාවිතා කරයි. බැංකුව මෙම ක්‍රියාමාර්ගය නොගත්තේ නම්, බැංකුව 2020/21 වසර තුළදීම එහි එක්සත් ජනපද ඩොලර් වගකීම් පැහැර හැරීමට සිදු වනු ඇත.

එක්සත් ජනපද ඩොලර්/රුපියල් හුවමාරු ගනුදෙනුවල විදේශ විනිමය අලාභයන් සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදී ALCO සහ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීමට භාණ්ඩාගාර ඒකකය පියවර ගෙන ඇත.

ALCO හි උපදෙස් පරිදි, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ එක්සත් ජනපද ඩොලර් අවශ්‍යතාවයට අරමුදල් සැපයීම සඳහා එක්සත් ජනපද ඩොලර්/රුපියල් හුවමාරු ගනුදෙනුවලට ඇතුල් වීමට

| | | |
|---|---|---|
| | බැංකුවට සිදු වූ නිසා, අපගේ ආයතනික බැංකු අංශය විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙතින් හුවමාරු පිරිවැයෙන් කොටසක් 2021 මැයි 21 දින සිට ආපසු අයකර ගැනීමට පියවර ගෙන ඇත. | |
| 3.4.11 මෙම එක්සත් ජනපද ඩොලර් හුවමාරු මිලදී ගැනීම් ප්‍රධාන වශයෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ණයවර ලිපි පියවීම සඳහා භාවිතා කරන ලද අතර 2021 වසර තුළදී බැංකුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙනුවෙන් ණයවර ලිපි විවෘත කර ඇති අතර එම මුදල එක්සත් ජනපද ඩොලර් 1,054,265,967 ක් සහ යුරෝ 139,736 ක් විය. බැංකුව අවස්ථා කිහිපයකදී ALCO අනුමත ශුද්ධ විදේශ විනිමය තත්ත්ව සීමාව[එක්සත් ජනපද ඩොලර් මිලියන 25 ක් ධන (long) හෝ ඍණ (short)] ඉක්මවා ගොස් ඇති බවත්, ශුද්ධ විදේශ විනිමය තත්ත්වය 2021 වසරේ දෙවන භාගයේදී බොහෝ දුරට ඍණ ලෙස පැවති බවත් වැඩිදුරටත් නිරීක්ෂණය විය. | බැංකුව 2021 දී ALCO අනුමත ශුද්ධ විදේශ විනිමය තත්ත්ව සීමාව ඉක්මවා නැත.<br>බැංකුව මුහුණ දුන් උග්‍ර විදේශ විනිමය තත්ත්වය හේතුවෙන්, 2021.09.28, 2021.10.30 සහ 2021.11.22 යන දිනවලදී අවස්ථා තුනකදී ශුද්ධ විදේශ විනිමය ආරම්භක තත්ත්ව (NOP)ඍණ සීමාව ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ලබාගැනීමට බැංකුව කටයුතු කර ඇති අතර මහ බැංකුවේ අනුමැතිය ලැබී ඇත.<br>තවද, ඉහත කී ශුද්ධ විදේශ විනිමය ආරම්භක තත්ත්වඍණ සීමාව ඉහළ නැංවීම සඳහා අපට ALCO හි අනුමැතිය ලැබී ඇත. | **ශුද්ධ විදේශ විනිමය ආරම්භක තත්ත්වයිමාව න් පිළිපැදිය යුතුය.** |
| 3.4.12රන්දිය ඩිස්ටිලරීස් ප්‍රයිවට් ලිමිටඩ්<br>සමාගම මත්පැන් නිෂ්පාදනය සහ බෝතල් කිරීමේ ව්‍යාපාරයක නිරතව සිටී. සමාගම මුලින් 1982 දී " රියෝ මාර්කටින් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්" නමින් සංස්ථාගත කරන ලද අතර පසුව " රන්දිය ඩිස්ටිලරීස් ප්‍රයිවට් ලිමිටඩ්" ලෙස නම වෙනස් කර ඇත.<br>මෙම ගනුදෙනුකරු බැංකුවට අලුත් වන අතර ඔවුන්ගේ ජංගම ගිණුම 2020.05.06 දින විවෘත කර ඇත. බැංකුව රු. මිලියන 250 ක පහසුකම ලබා දී ඇත. බැංකුවේ ණය ක්‍රියාපටිපාටි අත්පොතේ 05 වන ශීර්ෂයේ වගන්ති අංක. 6.2.4 ට අනුව, ආයතනික ඇපකර සහ/හෝ වෙනත් වංචල දේපළ ඇතුළු ඇපකරුවන්ගේ සුරැකුම මත සලකා බලන කාලීන ණය විශේෂයෙන් සඳහන් කළ නොමැතිනම් වසර 3 කට සීමා කළ යුතුය.<br>කෙසේ වෙතත්, ඉහත සඳහන් පහසුකම වසර 05ක් සඳහා සලකා බලන ලද නමුත්, මණ්ඩල විධායක ණය කමිටුවේ අනුමැතිය මත අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගේ සුරැකුමට එරෙහිව එම පහසුකම ලබා දී ඇත. තවද, ණය ක්‍රියාපටිපාටි අත්පොතේ 05 වන ශීර්ෂයේ වගන්ති අංක. 9.6 ට අනුව, ඔහු/ඇය/එය බැංකුවේ හෝ වෙනත් මූල්‍ය ආයතනයක අක්‍රීයණය ගැණුම්කරුවෙකු/ ඇපකරුවෙකු ලෙස පෙනී යන්නේ නම්පුද්ගල/ සංස්ථාපිත ආයතන ඇපයක් ලෙස පිළිගත නොහැකිය. කෙසේ වෙතත්, එම පහසුකම ලබා දීමට පෙර ඉහත කී ඇපකරුවන්ට ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ ඍජු හා වක්‍රව අක්‍රීය ණය වාර්තා තිබී ඇති බව විගණනයේදී හෙළිදරව් විය. | අදාළ BECC පත්‍රිකාවේ (683/2020) විචලනයන් අවධාරණය කර ඇත. එ්වා 2020.08.04 දින අපරඅනුමත කර ඇති අතර මුදල් ප්‍රවාහ පදනම මත සලකා බලා ඇත.<br>මෙම පහසුකම 2021.08.31 දින හෝ ඊට ආසන්න දිනකදී ප්‍රතිලේඛණ ගත කර ඇති අතර ඉන් පසුව මාසික වාරික අයකර ගැනීම සඳහා සමාගම රු. මිලියන 30.5 ක මුදලක් වාරික වශයෙන් අක්‍රමවත් ලෙස ගෙවා ඇත.<br>නැවත නැවත කරන ලද සිහි කැඳවීම් තිබියදීත් අඛණ්ඩව අක්‍රමවත්ව ආපසු ගෙවීමේ ප්‍රතිඵලයක් ලෙස, ණය ගැණුම්කාර සමාගමට සහ අධ්‍යක්ෂවරුන්ගේ පුද්ගලික ඇපකරයට එරෙහිව නඩු පැවරීමට බැංකුව තීරණය කර ඇත. නඩුවේ මීළඟ නඩු විභාගය 2022.11.25 දිනට යෙදේ. | අයකර ගැනීම් පිළිබඳ අඛණ්ඩ පසු විපරම් කිරීම් සහ නියමිත උපදෙස් පිළිපැදීම අවශ්‍ය වේ. |

## 4. මානව සම්පත් කළමනාකරණය

### විගණන නිරීක්ෂණය

| විස්තරය | මහජන බැංකුව | ලංකා බැංකුව | කොමර්ෂල් බැංකුව | සම්පත් බැංකුව | හැටන් නැෂනල් බැංකුව |
|---|---|---|---|---|---|
| සේවක සංඛ්‍යාව | 7568 | 8337 | 5072 | 4013 | 5024 |
| ශාඛා සංඛ්‍යාව | 742 | 581 | 287 | 229 | 255 |
| සේවකයෙකුට පිරිවැය රු.මිලියන | 3.01 | 3.00 | 3.22 | 2.38 | 2.14 |
| සේවකයෙකුට ලාභය රු. මිලියන | 3.13 | 4.51 | 4.65 | 3.10 | 9.35 |
| ශුද්ධ මෙහෙයුම් ආදායමෙන් ප්‍රතිශතයක් ලෙසපුද්ගලික වියදම් | 29.46 | 26.61 | 24.47 | 23.05 | 22.91 |

- බැංකුව වසරකට එක් සේවකයෙකු සඳහා රු. මිලියන 3.01 ක් දරා ඇතත්, 2021 වසර සඳහා එක් සේවකයෙකුගෙන් උපයා ඇති ලාභය රු. මිලියන 3.13 ක් පමණක් බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, අනෙකුත් බැංකු එක් සේවකයකුගෙන් රු. මිලියන 3.1 ක සිට රු. මිලියන 4.65 ක්දක්වා වූ ලාභයක් වාර්තාකර තිබුණි.

- 2021 වර්ෂය සඳහා බැංකුවේ ශුද්ධ මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් ලෙස පුද්ගල වියදම් සියයට 29.46 ක්වූ අතර එය අනෙකුත් බැංකු වාර්තාකර තිබූ සියයට 22.91 සිට සියයට 26.61 දක්වා වූ පරාසය හා සසඳන විට ඉහළම අගයක් නියෝජනය කරයි.

### කළමනාකාරණයේ අදහස් දැක්වීම

අදහස් සටහන් කර ගෙන ඇත.

### නිර්දේශය

සේවක කාර්යක්ෂමතාව ඉහළ නංවන අතරම බැංකුවේ අරමුදල් ඵලදායී ලෙස භාවිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ.

## 5. ගිණුම්කටයුතුභාවයසහයහපාලනය

### 5.1 උපායමාර්ගික සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021-2023වර්ෂ ආවරණය වන පරිදි මණ්ඩලය අනුමත කළ උපාය මාර්ගික සැලැස්මක් නොතිබුණි.බැංකුව මුලින් 2021-2023 කාලසීමාව සඳහා උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීමට සැලසුම් කර තිබුණද, උපදේශන සේවා ලබා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සැලකිය යුතු ලෙස ප්‍රමාද වීම නිසා 2021 වසර සඳහා වන සැලැස්ම සකස් කර 2022 වසරේ මැද දක්වා දීර්ඝ කර ඇත. ඒ සමග ආවරණය වන කාලය වෙනස් වී ඇත. | 2021-2024කාලසීමාව සඳහා මණ්ඩලය විසින් අනුමත කරන ලද උපාය මාර්ගික සැලසුම් ඔබගේ පරීක්ෂාව සඳහා ලබා ගත හැක. | සංයුක්ත සැලැස්ම නියමිත වේලාවට සකස් කිරීම නිර්දේශ කෙරේ. |